“මළවුන් නැගිටුවනු ලබන දිනයේ දේව විශ්වාසී මුඃමින්වරයකුගේ තුලාවේ ගුණදම්වලට වඩා බරැති කිසිවක් නොමැත. සැබැවින්ම අල්ලාහ් අසභ්ය දෑ කතා කරන, අශීලාචාර ක්රියා කරන අය කෙරෙහි කෝප වේ

නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් ප්රකාශ කළ බව අබූ දර්දා (රළියල්ලාහු අන්හු) තුමා විසින් මෙසේ වාර්තා කරන ලදී: “මළවුන් නැගිටුවනු ලබන දිනයේ දේව විශ්වාසී මුඃමින්වරයකුගේ තුලාවේ ගුණදම්වලට වඩා බරැති කිසිවක් නොමැත. සැබැවින්ම අල්ලාහ් අසභ්ය දෑ කතා කරන, අශීලාචාර ක්රියා කරන අය කෙරෙහි කෝප වේ." [صحيح] [رواه أبو داود والترمذي]

මළවුන් නැගිටුවනු ලබන දිනයේ දේව විශ්වාසී මුඃමින්වරයකුගේ තුලාවේ ක්රියාවන් හා ප්රකාශ අතරින් වඩාත් බරැති දෑ වනුයේ යහපත් ගුණදම් බව නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් දන්වා සිටියේය. එනම් සිනහ මුසු මුහුණ, හානි සිදුකිරීමෙන් ඉවත් වීම හා යහපත සිදු කිරීමය. ක්රියාවෙහි හා ප්රකාශයෙහි අශීලාචාරව කටයුතු කරන්නා කෙරෙහි හා ප්රකාශයෙහි අසභ්ය දෑ තෙපලන්නා කෙරෙහි උත්තරීතර අල්ලාහ් උරණ වේ.

http://sunnah.global/hadeeth/si/show/5371